**ස්ථායිකරණ ක්‍රමවේද මගින් නාය යෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය - 2022**
----------------------------------------------------------------------------------------

ස්ථායිකරණ ක්‍රමවේද මගින් නාය යෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව අතර 2019 අප්‍රේල් 25 දින එළඹි අංක එල් - 0124 ඒ දරන ණය ගිවිසුමේ II ආ (3) පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාල සීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, රාජ්‍ය ආරක්ෂක සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ආපදා අවම කිරීමේ භෞතික ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ නායයෑම් කළමනාකරණ හා සම්බන්ධ ප්‍රතිපත්ති හා රෙගුලාසි වැඩිදියුණු කිරීම තුළින් නායයෑම්වලින් සිදුවන අවදානම් සහ හානි අවම කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 18,396.08 කට සමාන එ.ජ.ඩො මිලියන 101.3 ක් වූ අතර ඉන් රු. මිලියන 14,528කට සමාන එ.ජ.ඩො මිලියන 80 ක් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2019 ජූලි 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 ජූනි 30 දින වනවිට අවසන් කිරීමට නියමිතව ඇත.

### 1.3 මතය

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| | රීති සහ රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් 01ක් පමණක් පවත්වා තිබුණි. | ව්‍යාපෘතිය විවිධ හේතූන් නිසා චක්‍රලේඛය ප්‍රකාරව මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට අපොහොසත්වී ඇත. | චක්‍රලේඛයේ ඇති උපදෙස් සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ආ) | ණය ගිවිසුම් අංක එල් - 0124 ඒ | ණය ගිවිසුමේ සියයට 84 ක් වෙනුවට සියයට 86ක ප්‍රතිපූරණ අනුපාත යෙදීම හේතුවෙන්, ව්‍යාපෘතියේ A අංශයේ වියදම් I කාණ්ඩය යටතේ 2020 ජූලි 01 සිට 2022 මාර්තු 31 දක්වා කරන ලද සිවිල් ඉදිකිරීම් වැඩ වියදම් | ව්‍යාපෘති ලේඛනයේ උප කාණ්ඩවල දක්වා ඇති පරිදි, සිවිල් ඉදිකිරීම් වැඩ සඳහා දරන වියදම් සඳහා සියයට 86 ක් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (ඒඅයිඅයිබී) වෙතින් මූල්‍ය කරනු ලබන | අතිරික්ත ගෙවීම ආපසු අයකර ගැනීමට බැංකුවෙන් කැමැත්ත ලබා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් 96,229ක් බැංකුව විසින් 2022 දෙසැම්බර් 31 දිනට රඳවාගෙන තිබුණි. . | අතර ව්‍යාපෘතිය ආරම්භයේ සිට පීඑම්යූ විසින් කොන්ත්‍රාත්කරුවන්ට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ අරමුදල් හරහා එවැනි ප්‍රතිශතයක් ගෙවා ඇත. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව ද පීඑම්යූ වෙත එවැනි ගෙවීමේ ක්‍රියා පටිපාටිය ඉදිරියට ගෙන යන ලෙස උපදෙස් දී ඇති අතර ණය ගිවිසුම සංශෝධනය කළ පසු රඳවා ගැනීමේ අරමුදල් නිදහස් කිරීමට එකඟ වී ඇත. තවද ඊආර්ඩී උපදෙස් පරිදි කැබිනට් පත්‍රිකාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පීඑම්යූ සකස් කිරීමේ කටයුතු කරමින් පවතී. | |
| (ඇ) | කැබිනට් පත්‍රිකා අංක 22/1362/604/028 | සෞඛ්‍ය අමාත්‍යාංශයට අත්‍යාවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය සැපයුම් මිලදී ගැනීමට මුදල් වෙන් කිරීම සඳහා කැබිනට් අනුමැතිය 2022 සැප්තැම්බර් 12 වැනි දින ලබාගත් නමුදු ඊට පෙර එනම් 2022 ජූලි 18 වැනි දින ණය ගිවිසුමේ සිදු කරන ලද සංශෝධන සඳහා ශ්‍රී ලංකා ජනරජය සහ බැංකුව අතර ගිවිසුමක් අත්සන් කර තිබුණි. | රටේ වත්මන් ආර්ථික තත්ත්වයට විසඳුමක් ලෙස රජය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව අතර අදාල තීරණය ගන්නා ලදී | ණය ගිවිසුම සංශෝධනය කිරීමට පෙර කැබිනට් අනුමැතිය ලබාගත යුතුය |

**2.2 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු**

| **විගණන ගැටලුව** | **කළමනාකරණයේ අදහස් දැක්වීම්** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සහ බඳවා ගැනීමේ ලිපියක් හෝ පත්වීම් ලිපියක් නොමැතිව කාර්යාල සහකාර තනතුරට දෛනික පදනම මත නිලධාරියෙක් බඳවාගෙන තිබුණි. | කාර්යාල සහකාර තනතුරට දෛනික පදනමින් නිලධාරියෙක් බඳවාගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය |